# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,855 — 1969 මැයි 22 වැනි බ්‍රහස්පතින්ද — 1969.5.22

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් .. .. .. | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම .. .. | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ දැන්වීම .. .. .. | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම .. .. .. | 65 |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු හැසි පිළිබඳ නිවේදන .. | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම .. .. .. | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම .. | — | නොතාරිස් ලැයිස්තුව .. .. .. | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම .. .. | — | විවිධ දැන්වීම .. .. .. | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම .. .. | — | | |


## බුදල් නඩු පිළිබඳ දැන්වීම

### නයිසයි ආඥාව

හොංකොං පදිංචිව සිට නැසීගිය ඇල්බට් කීර්තිසිංහගේ බුදලය පිළිබඳ කාරණාව ගැනයි.

නිලා කීර්තිසිංහ, දැනට පදිංචිය නො. 141, fපයිප් රෝඩ්, කොළඹ ........................................ පෙත්සම්කරු.

අංකය : 24551 /තෙස්තුමේන්තු එදිරිව

1. පී. ඇන් ද සිල්වා, නො. 141 fපයිප් රෝඩ්, කොළඹ
2. පී. ඇස්. කීර්තිසිංහ
3. ඇල්. කීර්තිසිංහ හොංකොං හී පදිංචිය...... වගඋත්තරකරුවෝ.

මේ කාරණාව පිළිබඳ විභාගය 1968 දෙසැම්බර් 17 වන දින කොළඹ දිස්ත්‍රික් විනිශ්චයකාර ඒ. වෛත්‍යලිංගම් මහතා ඉදිරියේ පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ආර්. වික්‍රමසිංහ මහතා පෙනී සිටියදී පෙත්සම්කරුගේ පෙත්සම සහ දිවුරුම් පත කියවා බලා,

පෙත්සම්කාරිය මියගිය අයගේ වැන්දඹුව බැවින් ඇය බුදලය පිළිබඳ බලකඩදාසි ලැබීමට හිමිකාරිය බැවින්, එම බුදලය පිළිබඳ බලකඩදාසි ඇය වෙත නිකුත් කරනවාට යම් කිසිවෙක් විරුද්ධවේ නම් එම විරුද්ධවාදිකම් වශී 1969 ජූනි මස 4 වන දින හෝ ඊට ප්‍රථම මෙම උසාවිය වෙත ඉදිරිපත් නොකළහොත් ඇය වෙත එකී බලකඩදාසි නිකුත් කරන ලෙස නියෝග කරන්ට යෙදුනා ඇත.

ඇල්. සමරතුංග,
අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන.

1968 දෙසැම්බර් 17 වැනි දිනදී,
කොළඹ දිස්ත්‍රික් උසාවියේදීය.

5--713/2

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## නයිසයි ආඥාව

මිහිරිපැන්නේ පදිංචිව සිට නැසීගිය වෙදගේ ලින්ටන් ද සිල්වා දීරසේකර නැමැත්තාගේ බූදලය පිළිබඳ කාරණාව ගැනයි.

වියුඩර් ද සිල්වා දීරසේකර, මිහිරිපැන්නේ. පදිංචිය... පෙත්සම්කරු.

අංකය : 9242 තෙස්තමේන්තු එදිරිව

1. වෙදගේ තියෝරිස් ද සිල්වා දීරසේකර
2. ජේන් නෝනා කුමාරසිංහ, දෙදෙනාම මිහිරිපැන්නේ පදිංචිය .............................................. වගඋත්තරකරුවෝ.

මේ කාරණාව පිළිබඳ විභාගය වර්‍ෂ 1969 පෙබරවාරි 21 වන දින පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ආර්. වික්‍රමසිංහ මහතා පෙනී සිටියදී ගාල්ලේ දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් සී. වී. උඳලාගම මහතා ඉදිරියේදී පෙත්සම්කරුගේ දිවුරුම් පෙත්සම සහ පෙත්සම කියවා බලා,

පෙත්සම්කරු එකී මියගිය අයගේ සහෝයුරා බැවින් ඔහුට එකී මියගිය අයගේ බූදලය පිළිබඳ බලකඩදාසි නිකුත් කිරීම උදෙසා යම් කිසිවෙක් විරුද්ධවේ නම් එකී විරුද්ධ කාරණා 1969 මාර්තු මස 7 වන දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් නොකළහොත් එකී බලකඩදාසි ඔහු වෙත නිකුත් කරන ලෙස නියෝග කරන්නට යෙදුනා ඇත.

සී. වී. උඳලාගම,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

1969 පෙබරවාරි 21 වන දිනදීය.

පිලියෙළ කළේ

ආර්. වික්‍රමසිංහ,
පෙත්සම්කරුගේ නීතිඥ.
7.3.1969.

විරුද්ධවාදිකම් පෙන්වීමේ දින 29.5.69 දක්වා දීර්ඝ කරන ලදී.

සී. වී. උඳලාගම,
දිස්ත්‍රික් විනිශ්චයකාර තැන.

ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේදීය.

5-713/1

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය.

**උපලේඛනය**

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 3. 1.69 | සිකුරාද | ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | | 9. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 16. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 24. 1.69 | සිකුරාද | ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 31. 1.69 | සිකුරාද | ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 7. 2.69 | සිකුරාද | ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 14. 2.69 | සිකුරාද | ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 2.69 | සිකුරාද | ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | ... | 7. 3.69 | සිකුරාද | ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 14. 3.69 | සිකුරාද | ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 3.69 | සිකුරාද | ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 28. 3.69 | සිකුරාද | .. | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද | ... | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 11. 4.69 | සිකුරාද | . . | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | | 18. 4.69 | සිකුරාද | .. | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | | 25. 4.69 | සිකුරාද | ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.50 |
| | | 30. 4.69 | බදාද | .. | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | ... | 9. 5.69 | සිකුරාද | ... | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | | 15. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 22. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 30. 5.69 | සිකුරාද | ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි | ... | 6. 6.69 | සිකුරාද | ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 13. 6.69 | සිකුරාද | ... | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 20. 6.69 | සිකුරාද | ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 27. 6.69 | සිකුරාද | ... | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණදෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි